# තොටුපොල කන්ද - ශ්‍රී ලංකාවේ තෙවන උස් කඳු මුදුන.

**තොටුපොල කන්ද නැගීමට උපදෙස්**

| | |
|---|---|
| **ගමනේ අරමුණ:** | තෙවන උස කඳු මුදුන තරනය , ජයාරූප ගැනීම,රාවණා ගැන කියවෙන ස්ථාන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම |
| **සංචාරය කල දිනය :** | 2014 පෙබරවාරි 15 |
| **සහභාගීවූවන් ගණන:** | 3 යි (නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, සෙන්තිවෙල් තුලසිදාස්) |
| **ගමන් කල ආකාරය:** | බදුල්ල රාත්‍රී තැපැල් දුම්රිය, ත්‍රිරෝද රථ, පා ගමන්, පොදු ප්‍රවාහන බස් රථ මගින් |
| **විශේෂ ස්තුතිය:** | ලසිත රත්නායක (මහඑළිය කඳවුරු බිම වෙන්කරවා ගැනීම) |
| **ගමනේ ස්වභාවය:** | කන්ද ආරම්භක ස්ථානයේ සිට එතරම් අපහසුවකින් තොරව ඉහලට යා හැක. එහෙත් ඔබශාරීරිකව නිරෝගීමත්ව සිටිය යුතුය |
| **ඇතුල්වීම:** | මහ එළිය තැන්නට ඇතුළුවීමට ඇති දොරටුවලින් හෝ වන ජීවී කාර්යාල වලින් අවසර ලබා ඇතුළු විය යුතුය |
| **ජායාරූප අනුග්‍රහය:** | නිශාන් කුළසිංහ, ලසිත රත්නායක, සෙන්තිවෙල් තුලසිදාස් |
| **මෙම වාර්තාව සැකසීම:** | නිශාන් කුළසිංහ විසිනි |

**ගමන් මාර්ග**

කොළඹ කොටුව දුම්රිය ස්ථානය >පට්ටිපොළ දුම්රිය ස්ථානය > මහඑළිය (හෝර්ටන්තැන්න)-පට්ටිපොළ පිවිසුම> තොටුපළ කන්ද > පට්ටිපොළ > නුවරඑළිය > කොළඹ.

www.LakViskam.org



**නවාතැන් පහසුකම්**

බත්තරමුල්ල වනජීවී කාර්යාලය ඇමතීමෙන් හෝර්ටන්තැන්න තුල ඇති නිවාඩු නිකේතන හා කදවුරු බිම් පිළිබඳව තොරතුරු ලබා ගත හැක (දුරකථන:0112888585). ඒවා වෙන්කරවා ගැනීමට අවශ්‍යනම් එම කාර්යාලවලට ගොස් සිදු කර ගත යුතුය. ඔබ පට්ටිපොළ ඔස්සේ පැමිණ තොටුපොල කන්ද පමණක් තරණය කරන්නේනම් නවාතැන් පහසුකම් අත්‍යාවශ්‍ය නොවේ. එයට එක් දිනක් පමණක් සෑහේ.

**පරිසරය පිළිබඳව**

මෙම ප්‍රදේශය කදුකර, තද ශීත දේශගුණය සහිත (සමහර අවස්ථාවල උෂ්ණත්වය සෙල්සියස් අංශක 5 වැනි අගයන්ට අඩු වන), නොඉඳුල් වලාකුළු වනාන්තර වලින් පරිපූර්ණ, ජල පෝෂක ප්‍රදේශයකි. මීදුමෙන්, වලාකුළෙන් වැසී යන හදිසි වර්ෂා ඇද හැලෙන,වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 2000ට වැඩි, තද සුළං සහිතතෙත් ප්‍රදේශයකි. එහෙත් කුඩැල්ලන් එතරම් දක්නට නොමැත.වනාන්තර තුල දිවියන්, ගෝනුන්, වල් ඌරා, ලේ මාපිලා, මීමැස්සා ආදී අනතුරුදායක සතුන් ගැවසිය හැක. අඩිපාර හා පොලොවේ ඇතැම් ස්ථාන ලිස්සන සුළුය. හදිසි ගල් පෙරලීම් හා පස් කඩා වැටීමෙන් තුවාල සිදු විය හැක. මේ සියලු පරිසර තත්වවලට පෙර සූදානමක් ඇතිව ඇඳුම්, උපකරණ හා බෙහෙත් ආදිය රැගෙන එහි යන්නේ නම් මැනවි.

**ඉතා වැදත් කාරුණික ඉල්ලීමයි**

මෙම මහඑළිය තැන්න ආශ්‍රිතව මහවැලි , කැලණි, වලවේ යන ගංගා වල උපත සිදු වේ. මෙම ගංගා වල ජලය ප්‍රයෝජනයට ගෙන සිදුකෙරෙන කෘෂිකර්ම, පානීය ජල අවශ්‍යතා, විදුලිය ජනනය, සංචාරක කටයුතු වැනි දෑ ඔබත් මටත් සෘජුවම බලපාන ඉතා වැදගත් කාර්යයන් වේ. එසේ නම් මෙම ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම ඔබගේත් මගේත් පරම යුතුකමයි. ඔබ හුදු විනෝදය සඳහා පමණක් එහි යන්නේ නම් මෙම පරිසර පද්ධතිය ඔබ ඇතුළු සියලු ජීවී ප්‍රජාවගේ උරුමයක් නිසා එය ආරක්ෂා කර ගතයුතු බවට නිරතුරු සිහිතබා ගන්න. වෙනත් කටයුත්තක් සඳහා එහි ගියද පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කරන්න. විශේෂයෙන් ගිනි මැල දැල්වීමෙන් වලකින්න. සිගරට් භාවිතා නොකරන්න. සිගරට් කොට වැටීමෙන් තෘණ පඳුරු පහසුවෙන් ගිනිගනී. පැළැටි, ශාඛ වලට හා සත්වයින්ටහානි නොකරන්න. ප්ලාස්ටික් ඇතුළු සියලු අපද්‍රව්‍ය ප්‍රදේශයට ගෙන යාම සීමා කර ඇත. ඒවා එම ප්‍රදේශයේ බැහැර නොකර ආපසු ගෙනවිත් නිසි ස්ථානයකදී පමණක් බැහැර කරන්න. ඔබ මත්පැන් පානය කර මෙම ප්‍රදේශවල සංචාරය කිරීමෙන් වලකින්න. එය ඔබගේත් පරිසරයේත් එහි වෙසෙන සමස්ථ ජීවී ප්‍රජාවගේත් යහපතට ඉවහල් වේ. ජලය හැර පරිසර පද්ධතියෙන් කිසිවක් ලබා නොගන්න. මේ පරිසර පද්ධතිය සියලු ජීවී ප්‍රජාවගේය. එම නිසාවෙන් එම පරසරය සුරකින්න. අපෙන් පසුවට එන ජීවී ප්‍රජාවටත් එය ආරක්ෂාකර තබන්න. මෙය 'ලක් විස්කම්' ඔබෙන් කෙරෙන ඉතා බැගෑපත් ඉල්ලීමයි!

www.Lakviskam.org

**ගමනට පිටත්වෙමු**

පෙර දින කිරිගල්පොත්ත නැගීමෙන් පසුව මහඑළිය කදවුරු බිමේ රැය ගත කර පසුදා හිම්දිරි උදෑසනමඅවදි වූ මා මහඑළිය තැන්න පුරා ඇවිද එහි හිම්දිරි අසිරිය නොඅඩුව විඳ ගත්තෙමි. පැය ගණනක් තැන්නේ කදු මතින් ඇවිද විවිධ සතුන් හා පක්ෂීන් දැක බලා ගත් මා නැවත කදවුරු බිමට පැමිනෙන විට අනෙක් සගයන් දෙදෙනා උදෑසන තේ හා ආහාර සකස් කරමින් සිටියහ. සීනි නොමැති වූ නිසා ජුජුප්ස් සමග තේ පානය කර අනතුරුව උදෑසන ආහාරය ගත්තෙමු. කූඩාරම හා බඩු අස්කර කදවුරු බිමද හොඳින් පිරිසිදු කර පෙ.ව. 9.25 ට ගමන් ආරම්භ කළෙමු.



ජුජුප්ස් සමග උදෑසන තේ...



කඳවුරු බිම අස් කරමින්

ප්‍රධාන කාර්යාලටපයින් ගොස් එහි සිට ත්‍රිරෝදරථයකින් තොටුපොල කන්ද නැගීම ආරම්භ කරන ස්ථානයට පැමිණියෙමු. මෙම ආරම්භක ස්ථානය පිහිටා ඇත්තේ හෝර්ටන් තැන්න පට්ටිපොළ පිවිසුමේ සිට මීටර් 500ක පමණ දුරිනි.ගමන් මාර්ගය ආරම්භ වන ස්ථානයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුව විසින් පිහිටුවන ලද දැන්වීම් පුවරුවක් වේ. එහි සඳහන් වන තොරතුරු මෙසේ උපුටා දක්වමු.

*"තොටුපළ කන්ද - ශ්‍රී ලංකාවේ කඳු මුදුන් අතරින් උසින් තෙවැනි ස්ථානය ගන්නා තොටුපළ කඳු මුදුන මත සිට පැහැදිලි දිනෙක නිරීක්ෂණය කරන ඔබට, බෞද්ධයන්ගේ පූජනීය ස්ථානයක් වන සමනළ කන්ද ඉතා පැහැදිලිව දැකගත හැකිය.*

*තොටුපළ කන්ද (රාවණා) ස්වභාවික මංපෙත, දුර - කි.මී. 2, ලඟා වීමට ගත වන කාලය - පැය 1 කි. ලගා වීමේ පහසුව - සාමාන්‍යයයි.*

www.LakViskam.org

*ඉපැරණි ගුවන් තොටක්...? රාම - රාවණා පුරාවෘත්තය...ඈත අතීතයේ ඉන්දියාවේ රජ කල රාම කුමරු තම රූබර බිරිඳ වූ සීතා කුමරිය සමග වන ගතව වාසය කරන කල්හී එහි පැමිණි ලංකාවේ බල සම්පන්න රාවණා රජුගේ සොහොයුරියට යම් අවහිරයක් කරන ලදැයි කියැවේ. එයින් කෝපයට පත් රාවණා දඬු මොණරයෙන් ඉන්දියාවට ගොස් රූබර සීතාව පැහැරගෙන ආවේය. සීතා දේවිය රැගත් දඬුමොණර යානය පළමුව ගොඩබස්සන ලද ප්‍රදේශය "තොටුපළ කන්ද" වූ අතර, වසර ගණනාවක් ඇයව සඟවා තැබූ ස්ථානය "සීතා එළිය" නම් විය. රාවණා රජුට තොටුපොළක් වූ එම කඳු මුදුන "තොටුපළ කන්ද" ලෙස පසුව ව්‍යවහාර විය".*




තොටුපොල කන්ද දැන්වීම් පුවරුව



ස්වභාවික මංපෙත

අප තිදෙනා පෙරවරු 10.30 ට කන්ද නැගීම ආරම්භ කළෙමු. මෙම ගමන් මාර්ගයේදී ජල මූලාශ්‍ර හමු නොවන බැවින් බීමට ජලය රැගෙන යාම ඉතා වැදගත් බව සිහි තබා ගන්න. ගමනේ ආරම්භක ප්‍රදේශය ගස් වැල් වලින්

ගහන පෙදෙසක් විය. ගමන් මාර්ගය පැහැදිලි එකකි.මෙම ප්‍රදේශයේ ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන  වලිකුකුළන් බහුලව සිටින අතර උන් තරගයට මෙන් කෑ ගැසීමෙන් වනාන්තරයේ ඇති දැඩි නිහැඬියාව පහවයයි."කුරුළු පාරාදීසය" යනුවෙන්ද හදුන්වන මෙම කන්ද ආශ්‍රිතව වලිකුකුලන්ට අමතරව දේශීය හා සංචාරක කුරුළු වර්ග රැසක් සැරිසරයි.නෙළුමල් පොහොට්ටු මෙම ප්‍රදේශයේදී විශාල වශයෙන්දැකිය හැකි විය. නෙළු මල් හා ඇට වලිකුකුලාගේ ප්‍රියතම ආහාරයක් වන අතර අධික ලෙස ඒවා කෑමෙන් උන් මත් භාවයට පත් වේ. කදුමුදුනට යත්ම හමු වන ගස් තද සුළඟ නිසා එතරම් උස්ව වැඩී නැති අතර පත්‍ර සිහින්ව සුළග තදින් හමන දිශාවට බරව වැඩී ඇත.


මිය ගිය වලිකුකුළා


කළු උකුස්සා

www.LakViskam.org

කැලෑ පෙදෙස තුලින් ඉතා පරීක්ෂාකාරීව ගමන්කිරීම්දී නිසොල්මනේ වැතිර සිටිනා වලිකුකුලෙකු හමු විය. අප මුලින් සිතුවේ උෟ නෙළු මල් ආහාරයට ගෙන මත් වී සිටින්නෙකු ලෙසය. ලංවී පරීක්ෂා කිරීමේදී මද වේලාවකට පෙර උගේ ප්‍රාණය නිරුද්ධ වූ බවක් දිස් විය. වලිකුකුලාට සමු දුන් අපට දක්නට ලැබුනේ ඉහල අහසේ යමක් සොයමින් මෙන් පරීක්ෂාකාරීව සැරිසරන කළු උකුස්සෙකි. වනාන්තර පෙදෙස අවසන් වීමෙන් පසු අප පිවිසියේ එළිමහන් පදුරු සහිත, එමෙන්ම ක්‍රමික නැග්මක් සහිත ප්‍රදේශයකටයි. වැඩි ආයාසයකින් තොරව ඉහලට ගමන් කල විට කදු මුදුන යයි හැගෙන එළිමහන් ස්ථානයකට පැමිණිය හැකි විය. නමුත් එය ප්‍රධාන කදු මුදුන නොවීය.


ශ්‍රී පාදය ඈතින් දිස්වන අයුරු


අඹේවෙල සුළං ටර්බයින හා පිදුරුතලාගල කන්ද

පෙබරවාරි මාසයේදී මහඑලිය තැන්නේ මීදුම දක්නට ලැබෙන්නේ ඉතාමත් අඩුවෙනි. මේ නිසා අපට අවට දර්ශනතල බාධාවකින් තොරව ඉතා හොඳින් නැරඹිය හැකි විය. පිදුරුතලාගල, කිරිගල්පොත්ත හා තොටුපොල

යන කඳු ත්‍රිත්වය රාවණා - රාම කථා පුවතේ එන "ත්‍රිකූට කඳු"ලෙස සැලකේ. සමනල කන්ද, පිදුරුතලාගල, කිරිගල්පොත්ත ඇතුළුව අග්‍රා-බෝපත් කඳු, නමුණුකුල කඳු, ග්‍රේට් වෙස්ටන්, බොරලන්ද සානුව, අඹේවෙල සුළං ටර්බයින, හක්ගල රක්ෂිතය හා එහි කඳු වැටිය, සීතාඑළිය ප්‍රදේශය, කිකිලියාමාන කඳු හා මහඑලියඉතා හොඳින් දර්ශනය වේ.




ත්‍රිකූට කඳු (කොළ පැහැති ත්‍රිකෝනයෙන්) සහ ශ්‍රී පාද (සමනල) කන්ද වම් පසින්

ගමනේ ඉලක්කය වෙත ලගාවීමට නම් මද තැනිතලාවක් ඔස්සේ ගොස් ඉතිරි කන්ද ද නැගිය යුතුය.මුදුනට ලගා වීමේදී සිහින් සන්නිවේදන කුළුනක මුදුනත මුලින්ම දර්ශණය වේ. තවත් විනාඩි කිහිපයක් ඉහලට ගමන් කිරීමෙන් පසු මුහුදු මට්ටමෙන් මීටර් 2359.46ක් උස ලංකාවේ උසින් තෙවන තැන ගන්නා කන්ද මුදුනටම ලගා වියහැක. අප මුදුනට ළගා වනවිට වෙලාව පෙ.ව. 11.45 විය.

රාවණා රජුගේ දඩුමොනර යානය මෙම කඳු මුදුන මත ගොඩබස්වා නවත්වා තබන්නට ඇතැයි සැලකිය හැකි කුඩා ප්‍රදේශයක් කඳු මුදුනමත ඇත.එම ප්‍රදේශය මදක්සමතලා ස්වභාවයකින් යුක්ත විය.දඩුමොනරය ගොඩබෑමේදී එයින් නිකුත්වූ විශාල එළිය නිසා මෙම කන්ද අයත් වන තැන්න, මහඑළිය වූ බවට කතාවක් ජනවහරේ එයි. රාමායනයට අනුව රාවණාගේ දඬුමොනරය ඇතුළු යානා ගොඩ බස්වන්නට භාවිතා කල තොටුපොලවල්හා යානා අලුත්වැඩියා කටයුතු කල ස්ථාන 7ක් පමණ ශ්‍රී ලංකාව තුල පිහිටා ඇත. ඒවානම් මහියංගනය ප්‍රදේශයේ ඇති වේරගංතොට, සහ ගුරුළුපොත,කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොළ, මාතලේ පිහිටි වාරියපොළ,දකුණු මුහුදු තීරයේ අම්බලන්තොට ආසන්නයේ පිහිටි උස්සන්ගොඩ, මස්කෙළිය කඳු වල පිහිටි ලක්ෂපාන -රාවණා ගල සහ මහඑළිය තැන්නේ පිහිටි තොටුපොල කන්දයි.මීට අමතරව අප මීට පෙර ගවේෂණය කල රම්බොඩ කඳුවැටිය ආසන්නයේ වූ "සීතා කඳුළු පොකුණ" පිහිටි කඳු මුදුනද ගුවන් තොටක් ලෙස අනුමාන කල හැක.

එකල දඬුමොණරය හැරෙන්නට සුදු වලාකුලින් පිරුණු අහසේ ගුවනින් ගමන් කළහැකි විවිධ යානා ලංකාවේ තිබූ බවට වාල්මිකීගේ රාමායනයේ එන ශ්ලෝකයක දැක් වේ.කන්දේ මුදුනට නැගෙනහිර දෙසින් වනාන්තරය මැදට වන්නට දුම්රිය මාර්ගය හා නාස්දණ්ඩ කන්ද හරහා දිවෙන ලංකාවේ තෙවැනි දිගම දුම්රිය උමග වන "ටනල් 18" පිහිටා ඇත.මෙම මාර්ගයේ ධාවනය වනදුම්රිය ශබ්ධයකඳු මුදුනටදහොඳින් ඇසේ. නාස්දණ්ඩ හා උඩමාල කඳු අතර, හක්ගල දැඩි රක්ෂිතයට අයත් වන වනාන්තරය තුල ඖෂධීය වැල් විශේෂයක් වන මංමුලා වැල් (නිල් වැල්)නමැති අපූරු ශාඛයක් ඇති බවට කියවේ. මෙම ශාඛයේ පත්‍ර වල ඇති කිරි ශරීරයේ තැවරුනහොත් සිහි විකල්ව දින

www.LakViskam.org

කිහිපයක් කැලයේ අතරමං වී සිටීමට සිදුවන බව පැවසේ.රාවණා විසින් සීතා දේවිය සගවා තබාගෙන සිටින විටඇය සොයා පැමිනි රාමගේ හමුදාවේ සෙබළුන්, වරපුරුෂයින් මෙම වැල් පැගී මංමුලා වූ බවට ජනප්‍රවාදයේ කියවේ.

තොටුපොල කඳු මුදුන හරහා බදුල්ල හා නුවරඑලිය දිස්ත්‍රික්ක වෙන්කෙරෙන දිස්ත්‍රික් මායිම වැටී ඇත. භූමිය මැනුම් කටයුතු වලදී ශ්‍රී ලංකාවේ මධ්‍යලක්ෂය ලෙස ගැනෙන ස්ථානයද මෙම කඳු මුදුන හා දුම්රිය මාර්ගය අතර ස්ථානයක පිහිටා ඇත. කඳු මුදුනේ වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ රේඩියෝ සන්නිවේදන කුළුණක් සහ එයට විදුලිය ලබා ගැනීමට සවිකළ සූර්යය පැනලද දක්නට ඇත. අප එහි යන විට පැරණි කුළුණ ගලවා දමා නව කුළුණක් සවි කර තිබුණි.


සන්නිවේදන කුළුණ


මහරත්මල්

www.Lakviskam.org

කඳු මුදුනේ සුළං ප්‍රවාහය සමග අවට හා තැන්න සිසාරා දිස්වූ චමත්කාර දසුන් මෙහි විස්තර කිරීමට වචන නොමැත.එදා සීතා දේවියරාවණා රජුගේ රාජධානියේ අසිරිය කෙසේ විඳගන්නට ඇත්දැයි අපද අනුමාන වශයෙන් වටහා ගැනීමට උත්සහ දැරුවෙමු.එකල එම කාලසීමාව නෙළු මල් වලින් බර වන කාලයක් වූයේ නම් සීතා දේවියට ඒ අසිරිය දැක දැස් අදහා ගන්නට බැරි වූ බවට නම් නොඅනුමානය. දඬුමොනර යන්ත්‍රයට කන්දේ සිට ඉතා පහසුවෙන් සීතාඑලිය හා අසෝක වනයට ගුවනින් ගමන් කරනට හැකි බව එහි සිට නිරීක්ෂණය කරන විට ඉතා පැහැදිලිව පසක් වේ.එනම් වලාකුළු වලට ඉහලින් පැමිණ පහසුවෙන් ගොඩබෑමට හැකි වීමත්, නැවත වලාකුළු අතර සැගවී යන්නටත් දඬු මොනරයට හැකි වන්නට ඇත.ටික වෙලාවක් කඳු මුදුනේ අසිරිය විඳ ගත් අප බිස්කට් අනුභව කර කන්දෙන් බැසීම ආරම්භ කළෙමු. කඳුකර පෙදෙසේ පීඩන වෙනස නිසා අප ගෙන ආ බිස්කට් පැකට් සුපුරුදු පරිදි පිම්බී තිබුණි.


පිම්බුණු බිස්කට් පැකට්


බෝවිටියා

ආපසු බැසීමේදී සමහර ස්ථාන වලදී පයලිස්සා යාමට ඉඩ ඇති බැවින් ප්‍රවේශම් විය යුතුය. අවට සිරි නරඹමින් පහලට ආ අපට පෙර සඳහන් කල මිය ගිය වළි කුකුළා එම ස්ථානයේ නොමැති බවටනිරීක්ෂණය විය. අපගේ අනුමානය වුයේ කන්ද නගිද්දී දුටු විශාල කළු උකුස්සා විසින් ඌව රැගෙන යන්නට ඇති බවයි. එසේත් නොමැතිනම් වෙනත් සතෙක් ඌව ආහාරයට ගන්නට ඇත.මධ්‍යහ්න 12.50 වන විට නැවතත් තාර පාරට පැමිණ ඒ ඔස්සේ පට්ටිපොළ දොරටුව දක්වා පයින් ගමන් ආරම්භ කළෙමු. දැඩි හිරු රශ්මිය නිසා එහි ගමන් කිරීම මදක් අපහසු විය. හොර්ටන් තැන්නේ පට්ටිපොළ දොරටුව අසලට ගොස් එහි කුඩා විලෙහි  වූ කහ නෙලුම් මල්වල අසිරිය විඳ පට්ටිපොළ බලා පයින් ගමන් ආරම්භ කළෙමු. දුම්රියෙන් කොළඹ බලා යාමට අදහස් කලත් දුම්රිය වැඩවර්ජනයක් නිසාඑම අදහස වෙනස් කොට පට්ටිපොළ සිට නුවරඑළියට බසයෙන් ගොස් නුවරඑළිය-කොළඹ බසයකින් කොළඹ බලා ආවෙමු.

අප සංචාරයේ තවත් ජයාරූප එකතුවක් මෙතනින් නරඹන්න

https://picasaweb.google.com/102500057347588371605/ThotupolaKandaViaMahaeliya2014?noredirect=1

මෙම වාර්තාවේ අයිතිය "ලක් විස්කම්" වෙබ් අඩවිය සතුය. © www.lakviskam.org(20-අප්‍රේල්-2014)

විමසීම් සහ අදහස්: lakviskam@gmail.com

www.LakViskam.org